# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2011 අංක 47 දරන නොතාරිස් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 නොවැම්බර් මස 24 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 නොවැම්බර් මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 3.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

# 2011 අංක 47 දරන නොතාරිස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 නොවැම්බර් මස 24 වැනි දින]

එල්. ඩී.—ඕ. 17/2011.

**නොතාරිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2011 අංක 47 දරන නොතාරිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතේ 31 වන වගන්තියේ, (16) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 107 වන අධිකාරයේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

"31 (16) (අ) ඉඩමෙහි හෝ වෙනත් නිශ්චල දේපළෙහි මායිම් ද, එහි බිම් ප්‍රමාණය ද, ඉඩම පිහිටා තිබෙන දිස්ත්‍රික්කය, පත්තුව, කෝරළය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, පළාත් පාලන ආයතන බල ප්‍රදේශය, ග්‍රාම නිලධාරී කොට්ඨාශය සහ ගම මෙන්ම එම ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ වෙනත් යම් බෙදීමක් ඇත්නම්, එය ද අඩංගු නිවැරදි සහ පැහැදිලි විස්තරයක් ද, එම ඉඩම පිහිටියේ පිළිවෙළින් (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහ නගර සභා ප්‍රදේශයක හෝ (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නගර සභා ප්‍රදේශයක හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද සංවර්ධන ප්‍රදේශයක නම් එහි වරිපනම් අංකය සහ වීථියේ නමක් ඇත්නම් එය ද, ඔප්පුවෙහි නැතහොත් නීත්‍යානුකූල ලේඛනයෙහි හෝ එයට යා කොට ඇති උපලේඛනයක හෝ අන්තර්ගතව ඇත්නම් මිස, අන්තිම කැමති පත්‍රයක් හෝ කොඩිසිල් පත්‍රයක් නොවන ඉඩම් හෝ වෙනත් නිශ්චල දේපළ කෙරෙහි බලපාන යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සහතික කිරීම හෝ එය සත්‍යායනය කිරීම ඔහු විසින් නොකළ යුතු ය.".

2—PL 006243-3,340 (2011/09)

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (26) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (අ) ඡේදය එහි (අ) ඡේදයේ (i) වන අනුඡේදය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(2) එකී නැවත අංක යෙදූ (අ) ඡේදයේ (i) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ii) ඉහත (i) වන අනුඡේදය යටතේ සකස් කරන ලද ලැයිස්තුවෙහි සහතික පිටපතක් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතන බලප්‍රදේශයක් තුළ ද, එම පළාත් පාලන ආයතනයේ කොමසාරිස්වරයා හෝ ලේකම්වරයා වෙත යවනු ලැබිය යුතු ය."

දෙවන උපලේඛනයෙහි "ඊ" ආකෘතිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ "ඊ" ආකෘතියේ 6 වන තීරයේ සඳහන් ශීර්ෂ පාඨය වෙනුවට "ඔප්පුවෙහි සඳහන් එක් එක් දේපළ සඳහා බලපාන පළාත් පාලන ආයතනයේ නම" යන ශීර්ෂය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.